මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.06.08

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 1/2018 (1)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමට අදාල 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 චක්‍රලේඛයේ වගන්ති පහත පරිදි මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

1. **"2.1 වගන්තිය" ඉවත් කෙරේ.**

2. **"2.6 වගන්තිය" ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

"2.6 මෙයට පෙර කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එය ආනයනය කිරීම සඳහා ණයවර ලිපිය විවෘත කල දින සිට / දේශීයව එකලස් කරන ලද මෝටර් රථයක් සඳහා පළමු ගෙවීම සිදු කල දින සිට වසර පහක (5) ක සක්‍රීය සේවා කාලයක් ඉක්මවා නොමැති නිලධාරීන්".

3. **"3.1 වගන්තිය" ඉවත් කෙරේ.**

4. **"05. ගෙවිය යුතු බදු ප්‍රමාණ" යටතේ ඇති ඡේදය ඉවත් කොට පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මගින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි 04 ඡේදයේ සඳහන් සීමාවන් යටතේ ලබා ගනු ලබන මෝටර් රථ/කැබ් රථ සඳහා "මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කර ඇති 2018.06.08 දිනැති අංක 2074/39 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ගැසට් පත්‍රයෙන් පනවා ඇති සහ එයට කලින් කලට සිදු කරනු ලබන සංශෝධන මගින් පනවනු ලබන බදු ප්‍රමාණයන් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවිය යුතුය".

මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ආනයනය කරනු ලබන/දේශීයව මිලදී ගනු ලබන වාහන වලට අදාල බදු සහන ලබා දෙනු ලබනුයේ එම වාහන මත පැනවෙන නිෂ්පාදන බදු සම්බන්ධයෙන් පමණි.

5. **"6.II පැවරීම " යටතේ ඇති 6.II.අ., 6.II.ආ. සහ 6.II.ඇ. වගන්ති වලින් පසුව 6.II.ඈ. වශයෙන් පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

"**6.II.ඈ.** මෙම චක්‍රලේඛය [වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 (1)] යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ආනයනය කරනු ලබන / දේශීයව මිලදී ගනු ලබන මෝටර් රථ / කැබ් රථ එහි හිමිකරුගේ ඉල්ලීම මත ඕනෑම අවස්ථාවකදී වෙනත් පාර්ශ්වයකට පැවරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට හැකියාව පවතී.

එමෙන්ම බලපත්‍ර ලාභියා මිය ගියහොත් වාහනයේ අයිතිය පැවරීම සඳහා කරනු ලබන ඉල්ලීම්, පවතින නීතිමය තත්වයන් යටතේ පැවරීම් කටයුතු සිදු කිරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාට බලය ලැබේ."

6. 8.4 ඡේදයේ ඇති වගන්තීන්ට පහලින් පහත වගන්තිය ද ඇතුලත් කෙරේ.

" නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම තොරතුරු MS Excel මගින් පහත ආකෘතිය අනුව සකස් කර නිකුත් කල දිනයේම මෙම දෙපාර්තමේන්තුවේ permitinfo@tipd.treasury.gov.lk දරන විද්‍යුත් තැපැල් ( E Mail) ලිපිනය වෙත යොමු කල යුතුය".

| බලපත්‍ර අංකය | බලපත්‍ර හිමියාගේ නම | ජා.හැ. අංකය | තනතුර | දෙපාර්තමේන්තුව /ආයතනය | අමාත්‍යාංශය/ පළාත් සභාව |
|---|---|---|---|---|---|
| T/45/VE... | | | | | |

7. ඇමුණුම I හි දක්වා ඇති උපදෙස් අනුව බලපත්‍රය අංක කල යුතුය.
8. ඇමුණුම II හි ආයතන සඳහා වන අංක සඳහන් කර ඇත.
9. ඇමුණුම III හි දක්වා ඇති අයදුම් පත්‍රය (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති අයදුම් පත්‍රය) මගින් පමණක් මේ සඳහා අයදුම් කල යුතුය.
10. බලපත්‍රයේ ආකෘතිය ඇමුණුම IV හි දක්වා ඇත.

මෙම සංශෝධනයන් 2018.06.09 දින සිට ක්‍රියාත්මක කෙරේ.

ඉහත සංශෝධනයන්ට යටත්ව 01/2018 චක්‍රලේඛයේ අනෙකුත් සියළු විධිවිධානයන් නොවෙනස්ව පවතී.

**ආර්.එච්.එස්. සමරතුංග**
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

01. විගණකාධිපති - අ.ක.ස
02. මහ බැංකුවේ අධිපති - අ.ක.ස
03. අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා
04. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති - අ.ක.ස
05. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව - අ.ක.ස
06. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා - අ.ක.ස
07. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර - අ.ක.ස
08. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන - අ.ක.ස
09. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් - අ.ක.ස.
10. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන - අ.ක.ස.